# රෝසි



විතුලි දිනුල්යා බණ්ඩාර

රෝසි

විතුලි දිනුල්යා බණ්ඩාර

කතෘ ප්‍රකාශනයකි

2023

ISBN: 978 – 624 -206 – 815 - 9

# පිදුම

මට අකුරු කියා දුන්

චාමිණි පල්ලියගුරු ගුරුතුමියට

ආදරයෙන් පිළිගන්වමි

# පෙරවදන

වත්මන් අධ්‍යාපනයෙන් එලදායි පුරවැසියෙකු සතටින් ජීවත් වන පවුලක් මෙන්ම ප්‍රඥාසම්පන්න දැනුමෙන් යුත් බහුවිධ කුසලතාවන් ගෙන් සපිරි පුරවැසියන් සහිත සමාජයක් ගොඩනැගීම අපේක්ෂාවයි . එසේ නම් පාසලට වගකීම් පවරන දරුවාගේ විභවතා හඳුනාගෙන ඒවා ඔපවත් කිරිම තුළින් ගෝලීය සමාජයට ගැලපෙන ලෙස හැඩගැස්වීම අපගේ වගකීමයි.එම ජාතිය අරමුණු මෙන්ම පාසලේ දර්ශනයට අනුව යමින් අපගේ මගපෙන්වීම යටතේ ලේඛන කරණය සහජයෙන් උරුමකරගත් මහමායා දියණියන් වසර ගනනාවක් සිට විවිධ අරමුණු පෙරදැරි කොට ගෙන ග්‍රන්ථකරණයට යොමු කිරිමේ ප්‍රතිපලයක් ලෙස දේශිය සාහිත්‍ය කෙතේ ලේඛන අංකුර දහස් ගනණක වැපිරීමට ලැබීම පාසලක් වශයෙන් ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් මෙන්ම කාලීන ජාතික අවශ්‍යතාවයක් සපුරා ලීමකි.

එහි ඉදිරි දිගුවක් ලෙස පාසල තුළ ගොඩනැගී ඇති පොත් ලිවිමේ සංස්කෘතිය මෙවර ඩිජිටල් තාක්ෂණික යුගයේ ස්මාර්ට් දරුවන්ට ගැළපෙන ලෙස නවීකරණය කරමින් "දිවිය දිනන විද්‍යුත් පොතක් " ව්‍යාපෘතිය හඳුන්වා දෙන ලදි. දරුවන්ට අත්දැකීම් සමුදායක් මෙනිම ගත් කතුවරයෙකුවීම හරහා ජීවිතයට එකතුවන වටිනාකම සළකා අධ්‍යාපන අමාත්‍යංශ අනුමැතියෙන් රටේ ම පාසල් දරුවන් සහෝදරත්වයෙන් අප හා එක් වීම අගය කරමි.

2023 සාහිත්‍ය මාසයට සමගාමී ව අප පාසල වාසානි සංවිධානය කළ "දිවිය දිනන විද්‍යුත් පොතක්" ව්‍යාපෘතියට එක්වූ පුංචි ලේඛක ලේඛිකාවන්ට මෙම කෘතිය තුළින් ලඅබුණු අත්දැකීම් ඉදිරි අධ්‍යාපනයට මෙන්ම අනාගත දිවියට ශක්තියක් වේවා යි ප්‍රාර්ථනා කරමු.

මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් සහය දැක්වූ අප පාසලේ කලමනාකරණ මණ්ඩලය ගුරුභවතුන් දෙමාපියන් ආදි ශිෂ්‍යාවන් සෙසු පාසල් වල දරුවන් යොමු කළ විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම නන් අයුරින් උපකාර කළ සැමට හෘදයාංගම ස්තුතියි.

ශශිකලා සේනාධීර

විදුහල්පතිනිය

මහාමායා බාලිකා විද්‍යාලය

මහනුවර

2023.11.01

අද මගේ උපන් දිනය. මට තෑගි ගොඩක් හම්බ වුනා.



ඒ අතර අපූරු තෑග්ගක් තිබුණා. ඒ ලස්සනම ලස්සන බෝනික්කෙක්. එයා හරිම ලස්සනයි. මම එයාට රෝසි කියලා නම දැම්මා.



මම රෝසි එක්ක හැමදාම සෙල්ලම් කරනවා. එයාව නාවනවා, ඇඳුම් අන්දවනවා. අම්මා රෝසි ට අන්දවන්න ගවුම් මහලා දුන්නා.



දවසක් අපේ ගේ ළඟ ඇළට ගියා රෝසි එක්ක නාන්න අපි ඇළට බැහැලා ඉද්දි. ටික එකපාරටම ලොකු වතුර පාරක් ආවා.



එක පාරටම රෝසිව මගේ අතින් අතෑරුණා. රෝසි ව වතුරේ ගහගෙන ගියා. මම පඳුරක් අල්ලා ගෙන බේරුණා.



මම කෑගැහුවා. ගොඩට ඇවිත් ඇළ දිගෙ රෝසි ව චේවා. නමුත් හම්බ වුනේ නෑ. මම අඬාගෙන ගෙදර ගියා.



අම්මා මට වෙන බෝනික්කෙක් ගෙනත් දෙන්නම් කීව්වා. ඒත් මට රෝසි නැතුව පාළුයි. එදා රෑ මට නින්ද ගියෙත් නෑ.



පහුවදා අක්කයි මමයි ඇළ දිගේ රෝසි ව හොයන්න ගියා. අපි හුගක් දුර ඇළ දිගේ ගියා. එක පාරටම පදුරක් අස්සේ කකුලක් පේන්න තිබුණා.



මම ඇළට බැහැලා පදුර අස්සේ බැලුවා. රෝසි පදුර අස්සේ හිර වෙලා හිටියා. මම රෝසි ව පදුරෙන් ඇදලා ගත්තා.



රෝසිගේ ඇගේ හොඳටම මඩ ගෑවිලා. අක්කා මමයි යි රෝසි ව නාවලා පිරිසිදු කරල ගෙදර ගෙනාවා.



මට හරිම සතුටුයි. රෝසි ව ආයෙත් හම්බවුනානේ. අපි රෝසි ට අළුත් ඇදුම් ඇන්දුවා



ආයෙත් රෝසි ත් එක්ක සෙල්ලම් කළා. හැබැයි ආය ඇළට නම් අරන් ගියේ නෑ. දැන් රෝසි හැමදාම මගේ ළග ඉන්නවා



# පසුවදන

නූතන තාක්ෂණික මෙවලම් භාවිතයට එකතුවීමත් සමග සිදුවන සමාජ ආර්ථික පරිවර්තනයන් හේතුකොටගෙන පොත පතින් දුරස්වන පාසල් දරුවන් නැවත පොත පතට සමීප කරවීම හරහා අධ්‍යාපනයේ ගුණාත්මක වර්ධනයක් ඇති කිරීම ඔවුන් ගේ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ඔප් නැංවීම තුළින් රටේ සාහිත්‍ය ප්‍රබෝධයක් ඇති කිරීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ දි මා විසින් අධ්‍යාපන අමාත්‍යංශයට පෞද්ගලික යෝජනාවක් ලෙස පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරණ ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය හදුන්වා දෙන ලදි.ඒ යටතේ ග්‍රන්ථ වැඩිම ප්‍රමාණයක් රචනා කරමින් වාර්තාවක් තබන්නේ මහමායා පුංචි ගත්කතුවරියන් ය. පාසල තුල ගොඩනැගි ඇති ලේඛන සංස්කෘතිය නව මාවතකට යොමු කරමින් රටේ සෙසු පාසල් දරුවන් හා එක්ව මෙවර ජාත්‍යන්තර පාඨකයන් වෙත ලගාවීමට නූතන තාක්ෂණය වා බැදුනු විද්‍යුත් කෘති රචනා කරන්නට විය.ඒ තුළින් සම්පාදනය වූ මෙම විද්‍යුත් කෘතිය දරුවන්ට අත්දැකීම් සමුදායක් ලබා දෙමින් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවට ඉවහල් වන අතර ම ඔවුන් ගේ හැගීම් දැනීම් නිර්මාණාත්මක හැකියාවන් ශාස්ත්‍රීය හික්මීම ප්‍රදර්ශනයකරන කැඩපතකි.මෙම නිර්මාණ රටේ අධ්‍යාපනයේ දිශානතිය මෙන්ම සමාජ ප්‍රගමනයට මග පෙන්වන නිසා ප්‍රතිපත්ති සම්පාදකයින් සහ සැලසුම් කරුවන්ට මෙන්ම වගකිව යුතු පාර්ශවයන්ට ආලෝකයක් සපයයි. පාසල් මට්ටමින් ආරම්භකර ජාතික තලය දක්වා විවිධ අභියෝග මැද පැමිණි මෙම ව්‍යාපෘතියේ ජීවය වූයේ මහමායා දියණියන් සහ පාසල් ප්‍රජාව බව ගෞරවයෙන් සිහිපත් කරමි.

දිවිය දිනන විද්‍යුත් පොතක් ව්‍යාපෘතියට මහමයා දියණියන් සමග එක්ව විද්‍යුත් කෘතියක් ජනගත කරන්නට ඩිජිටල් වේදිකාවට පිවිසි ගත්කතු අංකුර ඔබට ලෝකය දිනන ගත් කතුවරයෙකු වීමට ශක්තිය ලැබේවායි පතමු.

මෙයට

සෙනවිරත්න මහලේකම්

පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකළ ව්‍යාපෘතියේ නිර්මාපක

2023.11.01

ISBN : 978 – 624 – 206 – 815 - 2